# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- මොණරාගල

# මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2010

## 1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

i. ප්‍රාදේශීය පරිපාලනය සක්‍රීයව, ශක්තිමත්ව පවත්වාගෙන යාම සඳහා ජාතික මට්ටමේ ආයතන සමඟ සම්බන්ධීකරණය හා කාර්යයන් පහසුකරණය.

ii. විනිවිද භාවයෙන් යුතු කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍ය සේවාවක් තුළින් දිස්ත්‍රික්කයේ මහජන අවශ්‍යතා සපුරාලීම.

iii. දිස්ත්‍රික්කයේ රාජ්‍ය සේවකයන් මහජන අවශ්‍යතාවයන් පිළිබඳ සංවේදීව ක්‍රියාත්මක වීමට සමත් ආකල්ප වලින් පෝෂණය කිරිම.

iv. විධිමත්ව හා කාර්යක්ෂමව පරිපාලන කටයතු ක්‍රියාත්මක කිරිමට යෝග්‍ය වන පරිදි දිස්ත්‍රික්කයේ මානව හා භෞතික සම්පත් මෙහෙයවීම, කළමනාකරණය.

v. දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආදායමට බැර විය යුතු සියළු ආදායම් නිසි කලට, නිසි පරිදි එක්රැස් කරදීම.

vi. රාජ්‍ය නොවන සංවිධාන වල කටයුතු විදේශ ආධාර ව්‍යාපෘති සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරිම මගින් දිස්ත්‍රික්කයට ගලා එන සම්පත් වඩාත් ඵලදායී ලෙස යෙදවීම සහතික කිරිම.

## 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල

මොණරාගල
බුත්තල
වැල්ලවාය
තණමල්විල
බිබිල
මැදගම
බඩල්කුඹුර
මඩුල්ල
සියඹලාණ්ඩුව
කතරගම
සෙවනගල

## 3. වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම ගිණුම් වර්ෂයේ ආරම්භයේදී පිලියෙල කර නොතිබුණි.

## 4. ගිණුම්

### 4.1 මුළු ප්‍රතිපාදනය හා වියදම

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වූ පාදේශිය ලේකම් කාර්යාල 11 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.342,550,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.338,298,613 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ශුද්ධ ඉතිරි කිරීම් රු.4,251,387 ක් වූ අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.24 ක් විය.

| වියදම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය | ඉතිරිය,ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| රු. | රු. | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 241,400,000 | 241,400,000 | 237,507,345 | 3,892,655 | 1.61 |
| මූලධන | 101,150,000 | 101,150,000 | 100,791,268 | 358,732 | 0.35 |
| | **342,550,000** | **342,550,000** | **338,298,613** | **4,251,387** | **1.24** |

## 4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් පහත සඳහන් පරිදි එකතුව රු. 1,172,587,245 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඒවා උපයෝජනය පිලිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ලබාදුන් ප්‍රතිපාදනය රු. | තථ්‍ය වියදම රු. | 2010 දෙසැම්බර් 31 දිනට ඉතිරිය රු. |
|---|---|---|---|
| බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 2,593,231 | 2,153,241 | 439,990 |
| රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 219,455 | 200,752 | 18,703 |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 619,752,368 | 440,015,629 | 179,736,739 |
| ආපදා කලමනාකරණ අමාත්‍යාංශය | 5,130,619 | 4,789,927 | 340,692 |
| අධිකරණ අමාත්‍යාංශය | 1,364,055 | 1,164,936 | 199,119 |
| ප්‍රවාහන අමාත්‍යාංශය | 255,600 | 255,600 | 0 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 295,435 | 254,630 | 40,805 |
| ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 22,418,635 | 19,943,896 | 2,474,739 |
| රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 8,350,147 | 8,251,087 | 99,060 |
| සමාජ සේවා අමාත්‍යාංශය | 4,787,985 | 4,544,152 | 243,833 |
| කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 707,108 | 692,927 | 14,181 |
| සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 4,703,000 | 4,655,946 | 47,054 |
| තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 4,670,381 | 4,140,883 | 529,498 |
| ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 315,335 | 304,629 | 10,706 |
| දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 2,500,000 | 2,500,000 | 0 |
| ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 3,000,000 | 3,000,000 | 0 |
| නැවත පදිංචිකිරීමේ අමාත්‍යාංශය | 1,552,640 | 1,552,197 | 443 |
| වාරිමාර්ග හා ජලසම්පත් කලමනාකරණ අමාත්‍යාංශය | 833,796 | 705,867 | 127,929 |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 3,390,323 | 3,222,998 | 167,325 |

| | | | |
|---|---|---|---|
| යෞවන කටයුතු අමාත්‍යාංශය | 241,986 | 178,623 | 63,363 |
| පරිසර අමාත්‍යාංශය | 600,000 | 474,354 | 125,646 |
| රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 3,164,240 | 3,143,095 | 21,145 |
| පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංසංකරණ අමාත්‍යාංශය | 490,000 | 425,000 | 65,000 |
| බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 10,454,581 | 10,039,436 | 415,145 |
| සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 13,340 | 8,805 | 4,535 |
| පවෘත්ති දෙපාර්තමේන්තුව | 8,000 | 2,698 | 5,302 |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව | 4,202,558 | 3,832,562 | 369,996 |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 3,419,773 | 3,269,844 | 149,929 |
| සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 352,890,721 | 337,024,934 | 15,865,787 |
| ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 2,699,127 | 0 | 2,699,127 |
| ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව | 2,550 | 2,145 | 405 |
| පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 12,444 | 10,962 | 1,482 |
| ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 1,420,799 | 1,143,221 | 277,578 |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 99,846,091 | 89,354,294 | 10,491,797 |
| රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 218,630 | 217,083 | 1,547 |
| ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 4,832,036 | 4,576,448 | 255,588 |
| ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 412,045 | 412,045 | 0 |
| මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 818,211 | 572,232 | 245,979 |
| **එකතුව** | **1,172,587,245** | **957,037,078** | **215,550,167** |

## 4.3 විගණනය හා විගණන විෂය පථය

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 ජූනි 24 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිලබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිලිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිලිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරික්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිලියෙල කරන ලද්දකි.

## 4.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිලියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන් දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිලියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකිමට ඇතුලත් වේ.

## 4.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිලිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දනට මූල්‍ය ප්‍රකාශන හා පොත් අනුව මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙම වාර්තාවේ (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 4.6 සිට 4.16 දක්වා වූ ඡේදවල ඇතුලත් විගණන නිරික්ෂන වලට යටත්ව සතුටුදායක ලෙස පිලියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

**(අ) අයවැය විචලනය**

(i) වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් 28% ත් 55 % ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ වැය විෂයයන් 02 ක් සඳහා ප්‍රතිපාදන අවශ්‍යතාවය ඉක්මවා මාරු කිරීම නිසා රු.82,438 ක් ඉතිරිව තිබුණි.

**(ආ) පොදු තැන්පත් ගිණුම**

(i) වැල්ලවාය,තණමල්විල,සියඹලාණ්ඩුව හා බඩල්කුඹුර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල වර්ෂ 2 කට වැඩි රු.4,338,238 ක් වූ තැන්පත් ශේෂයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 215(3) හි විධිවිධානයන්ට පටහැනිව භාණ්ඩාගාර අනුමැතිය නොලබා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිපාදිත මුදලින් එකතුව රු.8,384,340 ක් පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 27701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ 2010 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එම දින වන විට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.5,332,923 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 4.6 වත්කම් කළමනාකරණය

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

2010 ඔක්තෝබර් 07 දින රු.467,500 ක් වැයකර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් වෙත ලබාදීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධති 11 ක් මිලදී ගෙන තිබුණි. මිලදී ගැනීමට ප්‍රථම මෙම පද්ධති භාවිතා කරන අන්දම පිළිබඳව කිසිදු පුහුණුවක් ලබාදී නොතිබු අතර පද්ධති වලට අදාල අත් පොත්ද සපයා නොතිබුණි. 2011 මාර්තු 09 දින වන විටත් මෙම පද්ධති ක්‍රියාකාරී තත්වයේ නොපවතින බැව් නිරීක්ෂණය විය.

### (ආ) බේරුම් නොකළ බැරකම්

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2010 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට අඩු බේරුම් නොකල බැරකම් වල වටිනාකම රු.313,765 ක් විය.

(ii) වැය විෂයයන් 3 කට අදාලව වාර්ෂක ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.146,972 ක බැරකම් වලට එළඹ තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු.49,691 ක් වූ බැරකම් ගිණුම් ගත කර නොතිබුණි.

## 4.7 අනුකූල නොවීම්

### (අ) නීති,රීති,රෙගුලාසි යතාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීත හා රෙගුලාසි වලට යොමුව. | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි | | |
| | • 104 (3) හා 104 (4) | ගණනය කර නැත | 2002 වර්ෂයේ අනතුරට පත්,වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ්රථයක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක හා අවසාන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| | • 104 (4) | ගණනය කර නැත | 2009 අප්‍රේල් 04 දින අනතුරට පත්ව තිබුණ ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයට අයත් ජීප් රථයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාර අවසන් වාර්තාව 2011 මාර්තු 09 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |
| | • 237 (ආ) | 60,000 | සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භාණ්ඩ ලැබීමට පෙර සැපයුම්කරු වෙත මුදල් ගෙවා තිබුණි. |

(ii) චක්‍රලේඛ විධිවිධාන

<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u>

| | | |
|---|---|---|
| 2009 මාර්තු 24 දිනැති 13/2008 (II) චක්‍රලේඛය | 335,010 | මඩුල්ල,බිබිල,මොණරාගල සහ කතරගම ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා වෙන්කළ වාහන වලට, නියමිත සීමාව ඉක්මවා ලබාගත් ඉන්ධන ලීටර් 4565ක් වෙනුවෙන් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

(iii) <u>අමාත්‍යාංශ චක්‍රලේඛ</u>

| | | |
|---|---|---|
| පාරිසරික හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශ ලේකම්ගේ 2007 ජූලි 31 දිනැති 01-2007 චක්‍රලේඛය | - | බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් විසින් අවස්ථා 60 කදී මෙම චක්‍රලේඛයට පටහැනිව ගෘහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදී තිබුණි. |

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වන වගන්තියෙහි සඳහන් විධි විධාන ප්‍රකාර බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.101,849 ක්ද , මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.29,615 ක්ද ,රඳවා ගැනීම් බදු අය නොකර සැපයුම් කරුවන්ට ගෙවීම් කර තිබුණි .

**4.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්**

මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2007 විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ කොහුකුඹුර ජීවවායු ඒකක හා කාබනික පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා රු.499,998 ක් වැයකර ටකරන් තහඩු 250 ක්, ඇල්කතින් නල මීටර් 1200 ක් සහ කිලප් හෝස් මීටර් 1123 ක් මිලදී ගෙන තිබුණ නමුත් 2010 නොවැම්බර් 02 දින වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුන අතර මිලදී ගත් ද්‍රව්‍ය කාර්යාල පරිශ්‍රයේ තිබුණි.

## (ආ) අපේක්ෂිත ප්‍රතිලාභ නොලද ව්‍යාපෘති

(i) තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ඉදුරුගස් වැව වැව් රක්ෂිතයේ පැල සිටුවීමේ කර්මාන්තය අනුමත සමිතියක් වෙත පවරා 2010 දෙසැම්බර් 31 දිනට අතරැදි මුදල් අඩුකර රු.177,750 ක මුදලක් සමිතිය වෙත ගෙවා තිබුණි. වැව් රක්ෂිතයේ කැලය හෙලි නොකර පැල සිටුවීම, නියමිත පැල ප්‍රමාණය සිටුවා නොතිබීම, සිටුවන ලද පැල වල ආරක්ෂාව සඳහා සකස් කල යුතු වැට නිසි පරිදි සකස් කර නොතිබීම යන අඩුපාඩු තිබියදී ඒවා නිසි පරිදි ඉටුකල බව දක්වමින් වාර්තා සකස් කර අනුමත සමිතියකට ඉහත මුදල ගෙවා තිබුන අතර මෙම කර්මාන්තය සඳහා දරන ලද වියදමින් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොතිබුණ බවද නිරීක්ෂණය විය.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය කර්මාන්ත හා ස්වයංරැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන රු.5,655,984 ක වියදමක් දරා නාගහමඩ ආහාර සැකසුම් නිෂ්පාදන ගම්මානය සඳහා පොදු පහසුකම් මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. 2011 මාර්තු 03 දින පරීක්ෂාවේද පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- නිමකර බාරදී තිබුණ ගොඩනැගිල්ල 2011 මාර්තු 03 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.
- අලෙවි සැල් ගොඩනැගිල්ලේ වහලයේ කුමේර නිසි පරිද නොබැඳීම නිසා ගොඩනැගිල්ල තුලට ජලය කාන්දු වෙමින් තිබුණි.
- අලෙවි සැල් ගොඩනැගිල්ලට සවිකරන ලද විදුලි උපාංග වලින් කොටසක් සොරකම් කර තිබුණි.

## 4.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### ගැලපුම් කලයුතු ශේෂ

2010 දෙසැම්බර් මාසය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් පිළියෙල කර තිබූණ බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුනු ගැලපුම් පිළිබඳ විග්‍රහයකට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| <u>ගැලපුම් පිළිබඳ විස්තරය</u> | <u>කාල විශ්ලේෂණය</u> | | |
|---|---|---|---|
| | **මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු** | **වර්ෂ 01 ට වැඩි වර්ෂ 03 ට අඩු** | **<u>එකතුව</u>** |
| | රු. | රු. | රු. |
| උපලබ්ධි නොවූ තැන්පත් | 1,170 | 200 | 1,370 |
| නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් | 106,982 | 67,495 | 174,477 |
| **එකතුව** | 108,152 | 67,695 | 175,847 |

## 4.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණ සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණ වලදී එසේ අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

### (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

වර්ෂ ගණනාවකට පෙර විශ්‍රාම ගිය රියදුරන් දෙදෙනෙකු රජයේ නිවාස 02 ක අනවසරයෙන් පදිංචිව සිටින අතර ඔවුන් ඉවත් කිරීම සඳහා 2011 අප්‍රේල් 30 දින වන විටත් ප්‍රමාණවත් නීත්‍යානුකූල පියවර ගෙන නොතිබුණි. රජයේ නිවාස බාර දීමට ප්‍රථම මොවුන්ගේ විශ්‍රාම ලියකියවිලිද නිදහස් කර තිබුණි.

### (ආ) බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන සිහි කෙසෙල් පැල 24327 ක් මිලදී ගැනීම වෙනුවෙන් 2010 සැප්තැම්බර් මාසයේදී රු.485,820 ක මුදලක් සැපයුම් කරුවන්ට ගෙවා තිබුණි. මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරන ලැබේ.

(i) මිලදී ගත් පැල ප්‍රමාණය 24,327 ක් ලෙස දක්වා තිබුණත් බෙදාහැරීම් ලේඛන අනුව බෙදාහරින ලද පැල ප්‍රමාණය 22,870 ක් විය. ඒ අනුව පැල 1,457 ක් අඩුවෙන් සපයා තිබුණත් පැල 24,327 ක් වෙනුවෙන් මුළු මුදලම ගෙවා තිබුණි

(ii) රතුගල්ල හා අංකඩ යන ග්‍රාම නිලධාරි වසම් 02 සඳහා සීන කෙසෙල් පැල 20862 ක් මිලදී ගෙන තිබුණු නමුත් බෙදා හැරීම් ලේඛන අනුව පැල 22470 ක් බෙදාහැර තිබුණි. ඒ අනුව මිලදී ගත් පැල ප්‍රමාණයට වඩා පැල 1608 ක් වැඩිපුර බෙදාහැරීම හේතුවෙන් සාවද්‍ය ලෙස බෙදාහැරීම් ලේඛන සකස් කර ඇති බව නිරීක්ෂණය විය.

(iii)එකිනෙක ප්‍රතිලාභීන්ට බෙදාහැරීම් ලේඛන අනුව බෙදා දී ඇති බව දැක්වෙන පැල ප්‍රමාණයට වඩා පැල 610 ක් අඩුවෙන් ලැබී ඇති බව 2010 නොවැම්බර් 19 දින ප්‍රතිලාභීන් තිදෙනෙක් පිළිබඳව සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය.

## 4.11 අවිධිමත් ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම්

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මාර්ගෝපදේශ 1.2.1 සහ 3.2 ට පටහැනිව රුපියල් මිලියන 02 ඉක්මවා රු.6,787,835 ක් වටිනා කර්මාන්ත 02 ක් කොටස් 04 කට වෙන්කර අනුමත සමිති 03 ක් වෙත ලබාදී තිබුණි.

(ii) මාර්ගෝපදේශ 9.3.1 (ආ) ප්‍රකාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන දිස්ත්‍රික් ලේකම් කාරයාලය විසින් වාහන 02 ක් අලුත්වැඩියා කිරීමට රු. 470,197 ක් ද ,මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එක් වාහනයක් අළුත්වැඩියා කිරීමට රු.252,915 ක්ද ගෙවා තිබුණි.

(iii) මාර්ගෝපදේශ 2.7.7 ප්‍රකාර ප්‍රසම්පාදන කමිටුවට දෙපාර්තමේන්තුවෙන් බාහිර නිලධාරියකු සම්බන්ධ කර නොගෙන සහ 2.11.3 වගන්තිය ප්‍රකාර මිල විශ්ලේෂණ වාර්තා සකස් නොකර සෙවනගල ප්‍රාදේශී ලේකම් කාර්යාලය විසින් රු.674,308 කද , බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.2,912,550 කද මිලදී ගැනීම් කර තිබුණි.

(iv) මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන අනුගමනය නොකර බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවස්ථා 04 කදී රු.818,555 ක භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(v) මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2010 දෙසැම්බර් 31 දින රු.229,000 ක් වටිනා ඩුප්ලෝ යන්ත්‍රයක් මිලදී ගැනීමේද මාර්ගෝපදේශ 2.11.3 ප්‍රකාර තාක්ෂණික ඇගැයීම් වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

**(ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

(i) දිස්ත්‍රික් ලේකම් නිල වාහනය වෙනුවෙන් ලබා දෙනු ලබන ඉන්ධන දීමනාව හා බිල්පත් මත දරන ලද ඉන්ධන වියදම, එකී කාලය තුල ධාවනය කර ඇති කිලෝමීටර් ප්‍රමාණයට සාපේක්ෂව අසාමාන්‍ය තත්ත්වයක් විය. 2010 ජුනි, ජූලි, අගෝස්තු, සැප්තැම්බර් හා නොවැම්බර් යන මාස 05 තුල ධාවනය කර ඇති දුර ප්‍රමාණයට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණයට වඩා රු.80,570 ක් ඉන්ධන වෙනුවෙන් දරා තිබුණි. 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහන සඳහා හිමි ඉන්ධන සීමාව ඉක්මවා 2010 වර්ෂය තුළදී පරිභෝජනය කරන ලද රු.387,275 ක් වටිනා ඉන්ධන ලීටර් 5276 ක් සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරියකුට වෙන්කරන ලද වාහනයක් සඳහා 2010 පෙබරවාරි, ජුනි, ජූලි, සැප්තැම්බර් හා නොවැම්බර් යන මාස 05 තුලදී ධාවනය කර ඇති දුර ප්‍රමාණයට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණයට වඩා වැඩියෙන් දරන ලද ඉන්ධන වියදම රු.24,146 ක් විය. 2010 වර්ෂය තුලදී අනුමත සීමාව ඉක්මවා පරිභෝජනය කර ඇති රු.201,494 ක් වටිනා ඉන්ධන ලීටර් 2745 ක් සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) නිලධාරියකුට වෙන්කරන ලද නිල වාහනයක් අලුත්වැඩියා කිරීම සඳහා 2010 ඔක්තෝබර් මාසය තුල ගරාජයකට බාර දී තිබුණු අතර එම මාසය සඳහාද නිල වාහනය සඳහා හිමි රු.8,808 ක ඉන්ධන දීමනාව අදාල නිලධාරියාට ගෙවා තිබුණි.

(iv) විධිමත් අනුමැතියක් නොමැතිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2010 අගෝස්තු 26 දින රු.49,840 ක් වැය කර මිලදී ගෙන තිබුණ ජංගම දුරකථනයක වටිනාකම අදාල නිලධාරියාගෙන් අයකර ගෙන නොතිබුණි.

## 4.12 පාඩු හා හානි

### (අ) බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ මිලදී ගත් උදලු තල 261 ක් නිෂ්පාදිත ආයතනයෙන් මිලදී නොගෙන වෙනත් ආයතනයකින් මිලදී ගැනීම නිසා රු.31,581 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

### (ආ) කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

2009 අප්‍රේල් මාසයේ දී මිය ගිය විශ්‍රාමිකයෙකු වෙනුවෙන් 2009 නොවැම්බර් දක්වා මාස 07 ක් වෙනුවෙන් රු.130,888 ක් විශ්‍රාම වැටුප් ලෙස ඇයගේ ගිණුමට ගෙවා තිබුණි. 2010 දෙසැම්බර් 09 දින වන විටත් එසේ වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් මුදල අයකරගෙන නොතිබුණි.

## 4.13 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එකිනෙක වැය විෂයයන්ගේ අරමුණ හා ස්වභාවය සැලකිල්ලට නොගෙන එම වැය විෂයයන්ට අදාල නොවන එකතුව රු.533,294 ක් වූ වියදම් **සදොස්** ලෙස වෙනත් වැය විෂයයන්ට හර කර තිබුණ අතර රු.3,248 ක ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වැය විෂයයකටද රු.84,270 ක පුනරාවර්තන වියදම් ප්‍රාග්ධන වැය විෂයයන් 02 කට හර කර තිබුණි.

(ආ) බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.24,579 ක් වූ වියදම් **සදොස්** ලෙස වැරදි වැය විෂයයන්ට හර කර තිබු අතර තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් රු.46,500 ක් පුනරාවර්තන වැය විෂයයන්ට හර කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වී මිලදී ගැනීම සඳහා 2010 මාර්තු 23 දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් රු.10,000,000 ක මුදලක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලැබී තිබුණි. මෙම මුදලින් රු.4,000,000 ක මුදලක් පමණක් වියදම් කර තිබු අතර ඉතිරි රු.6,000,000 ක මුදල මාස 09 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව ගිණුමේ තබාගෙන 2010 දෙසැම්බර් 31 දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ආපසු යවා තිබුණි.

**(ඇ)** මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2010 දෙසැම්බර් 31 දින ලියන ලද රු.597,608 ක් වටිනා චෙක්පත් 05 ක් 2011 මාර්තු 01 දින වන විටත් ආදායකයන් වෙත බාරදී නොතිබුණි.

**(ඉ)** දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 ක් විසින් 2004 සිට 2009 දක්වා වූ වර්ෂ වල මිලදී ගෙන තිබූ භාණ්ඩ ඒකක 1162 ක් 2010 නොවැම්බර් 30 දින දක්වා බෙදාහැරීමට ක්‍රියාකර නොතිබුණි.

**(ඊ)** ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 ක් විසින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ලබා දුන් ණය මුදල් නිසි පරිදි අය වී නොතිබුණ අතර 2010 දෙසැම්බර් 31 දිනට අය විය යුතු හිඟ ණය මුදල රු.7,713,930 ක් විය.

(උ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සෙවනගල විජය සමෘද්ධි වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2010 සැප්තැම්බර් 13 හා නොවැම්බර් 08 දින එකතුව රු. 4,000,000 ක මුදලක් ලැබී තිබුණත් 2011 මාර්තු 09 දින වන විටත් ඇස්තමේන්තුවක් හෝ සකස් කර නොතිබුණි.

(ඌ) තණමල්විල,මැදගම,බිබිල,බඩල්කුඹුර,කතරගම හා සෙවනගල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අදාල සමෘද්ධි බැංකු සංගමයන් විසින් විවිධ ව්‍යාපෘති සඳහා ලබා දී තිබූ ණය මුදල් නිසි පරිදි අය වී නොතිබූ අතර 2010 දෙසැම්බර් 31 දිනට හිඟ ණය මුදල රු.15,879,669 විය.

## 4.14 විගණනය සඳහා නොලද සාක්ෂි

2010 වර්ෂයේ සමෘද්ධි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මිලදී ගත් රු.3,019,500 ක් වටිනා පැල,බීජ,පොහොර හා කුකුළු පැටවුන් සංඛ්‍යාව තොග පොත්වලට ගෙන නොතිබුණ අතර ප්‍රතිලාභීන් හට බෙදා හැර ඇති ආකාරය දැක්වෙන ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 4.15 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 39 | 37 | 02 |
| තෘතීයික මට්ටම | 23 | 05 | 18 |
| ද්විතීයික මට්ටම | 637 | 534 | 103 |
| ප්‍රාථමික මට්ටම | 112 | 94 | 18 |
| අනියම් / ආදේශක | - | 08 | - |
| එකතුව | 811 | 678 | 141 |

## 4.16 අභ්‍යන්තර පාලනය

### (අ) අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### (ආ) විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.